මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka


මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක **:LAE/2025/102**

**2025.05.27**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

**76අ වගන්තිය යටතේ නියමය**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු එක් එක් පක්ෂය/ කණ්ඩායම විසින් එකී පක්ෂයට හෝ කණ්ඩායමට අදාළ වූ කාන්තා සභිකයන් ඇතුළුව තෝරා එවිය යුතු සභිකයන් මැතිවරණ කොමිෂන් සභාව වෙත එම ඡන්ද විමසීම අවසන් වූ විගස දැනුම් දිය යුතු වුව ද, ඡන්ද විමසීම අවසන් වී මේ වන විට දින 21 ක් ගතව ඇතත් තෝරා එවිය යුතු නියමිත සභික සංඛ්‍යාව මෙතෙක් මැතිවරණ කොමිෂන් සභාව වෙත නම්කර එවා නොමැති හෙයින් ද,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අංක 2424/02 හා 2025.02.17 දිනැති ගැසට් නිවේදනය අනුව 2025.06.02 වැනි දින සිට පළාත් පාලන ආයතනවල ධුර කාලය ආරම්භ විය යුතු බවට නියම කර ඇති හෙයින් ද,

විෂයභාර අමාත්‍යවරයාගේ නියෝගයට අනුව පළාත් පාලන ආයතනවල ධුර කාලය ආරම්භ කිරීමට පෙර තේරී පත් වූ සහ තෝරා එවා ඇති සභිකයන් ගැසට් පත්‍රයේ පළ කළ යුතුව ඇති බැවින් එක් එක් පක්ෂය සහ කණ්ඩායම විසින් තෝරා එවිය යුතුව ඇති සියලුම සභිකයන්ගේ නම 2025.05.30 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පෙර අදාළ පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරී වෙත නම් කර යැවිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම නියමය මැතිවරණ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2438/13 දරන හා 2025.05.27 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ද පළ කර ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)